තුනුක්කායි ප්‍රාදේශීය සභාව
මුලතිව් දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 01 දින ද, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2016 දෙසැම්බර් 31 දිනට තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදවු කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්‍ෂණ සිදු කෙරේ.

(අ) පරිත්‍යාග කරනු ලැබූ වාහන 08 ක වටිනාකම පසුගිය වසර 04 පුරාම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 1,917,672 දේපළ 04 ක වටිනාකම, හිමිකම් ඔප්පු සහ තක්සේරු වාර්තා නොමැතිකම නිසා පසුගිය වසර 05 ක කාලපරිච්ඡේදය පුරාම විගණනයේදී සතුටුදායක ලෙස නිශ්චය කළ නොහැකි විය.

(ඇ) එකතුව රු.4,502,008 ක්වූ ප්‍රාග්ධන වැඩ වටිනාකම සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධනගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ දේපළ වටිනාකම අඩුවෙන් දැක්විණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී රු. 2,888,584 ක්වූ සමුච්චිත ක්ෂය ප්‍රමාණයක් නිරීක්ෂණය වූ නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම වැඩියෙන් දැක්වීමක් පෙන්නුම් කෙරේ.

1.3.3 ලැබියයුතු මුදල්
-----------------

විශ්‍රාමික නිලධාරියෙකුගෙන් ලැබිය යුතුව තිබෙන රු. 35,607ක් වූ ණය ශේෂ අයකර ගැනීම සඳහා පසුගිය වසර 05 ක් පුරාම අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

1.3.4 නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදය ii රීති - 66 | එකතුව රු.3,196,798 ක්වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) පරිච්ඡේදය iii රීති - 33 | සමාලෝචිත වර්ෂය තුළදී වරිපනම් තක්සේරුව සිදුකර නොතිබුණි. |
| (iii) පරිච්ඡේදය iii රීති - 59 සහ 60 | සමාලෝචිත වර්ෂය තුළදී වෙළඳ බදු තක්සේරුව සිදුකර නොතිබුණි. |
| (iv) පරිච්ඡේදය iv රීති - 108 | තුනුක්කායිහි ඉදිකරන ලද ළමා උයන නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (v) පරිච්ඡේදය v රීති - 140 | එකතුව රු. 597,570 ක්වූ නිරවුල් නොකළ අත්තිකාරම් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (vi) පරිච්ඡේදය ix රීති - 180 | මුදල් හා ගබඩා භාර කටයුතුවල නියැලි නිලධාරීන්ගෙන් ආරක්ෂණ ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මුදල් රෙගුලාසි අංක 571 | එකතුව රු.499,074 ක්වූ කල් ඉකුත් තැන්පතු 23 ක් පිළිබඳ වසර 02 කට අධික කාලයක් තිස්සේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) වගන්තිය 5-4-12 | එකතු කළ අගය මත වූ බදු සඳහා වූ ආවරණ ගෙවීම සිදුකළ මාසයට පසුව එළඹෙන මාසයේ 15 දින හෝ ඊට ප්‍රථම එම ගෙවීම් පිළිබඳ විස්තර විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වෙත දැන්වීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ රු.12,465,289 ක්වූ ආදායම් අතිරික්තය, ඉකුත් වර්ෂය සඳහා වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය වූ රු. 11,428,845 ක මුදල හා සැසඳූ විට පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තයේ රු. 1,036,444 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. සභාවේ ප්‍රාග්ධන වත්කම් නඩත්තු හා අළුත්වැඩියා වියදම අඩුවීම, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අතිරික්තය වූ රු. 9,367,364 ක මුදල ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූපි අතිරික්තය වූ රු. 11,106,817 ක මුදල හා සැසඳූ විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,739,453 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

2.3. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ රු. 44,038,308 ක්වූ කාරක ප්‍රාග්ධනය, ඉකුත් වර්ෂය සඳහා වූ අනුරූපි කාරක ප්‍රාග්ධනය වූ රු. 34,615,160 ක මුදල සමඟ සැසඳූ විට, සමාලෝචිත වර්ෂය සඳහා වූ කාරක ප්‍රාග්ධනයේ රු. 9,423,148ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් කළමනාකරණය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම,තත්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු සභාව විසින් ඉදිරිපත් කළ පරිදි පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත මුදල | තත්‍ය මුදල | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | - | - | - |
| කුලි හා බදු කුලි | 11,568 | 7,097 | 207 |
| බලපත්‍ර ගාස්තු | 210 | 531 | - |
| අනෙකුත් ආදායම් | 9,149 | 7,203 | 2,990 |
| එකතුව | 20,927 | 14,831 | 3,197 |

2.4.2 **විදුලි සංදේශන කුළුණු ගාස්තු අයකිරීම**

සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ විදුලි සංදේශ කුළුණු සම්බන්ධයෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියමනයන් ප්‍රකාරව සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම, මූලික සැලසුම් අනුමත කිරීම, අනුකූලතා සහතික නිකුත් කිරීම සහ ආවරණ අනුමැතිය ලබාදීම යන සිව් ආකාරයේ ගාස්තු රු.152,000 ක් තක්සේරු කර ගිණුම්වලට ගතයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) පළාත් පාලන කොමසාරිස් ජනරාල් විසින් පරිත්‍යාග කරන ලද වාහන 09 ක අයිතිය ලබාගැනීම සඳහා අර්ථදායක ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සභා සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 13 ක් පිරවීම සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් සංවර්ධන කටයුතුවලට බලපෑමක් සිදුව ඇති බැව් පෙනීයයි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 756 හා 757 ට අනුකූලව පිළිවෙලින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතු වාර්ෂික ගබඩා සමීක්ෂණ වාර්තාව අනුව ගත් ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා විගණනයට ලබා නොදුනි.

(ආ) සභාවට අයත් පුස්තකාල පොත් 266 ක් පිළිබඳ ඉකුත් වර්ෂයේ සිදුවූ ඌනතාවය පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(ඇ) ලෝක ආහාර වැඩසටහන විසින් පරිත්‍යාග කළ ඉන්වෙන්ට්‍රි අයිතම 132 ක් ඉකුත් වසර 07 ක් පුරාම ගබඩාව නිශ්ක්‍රියව පැවතීමට ඉඩහැර තිබු අතර, එම අයිතමවල වටිනාකම විගණනයේදී සතුටුදායක අන්දමින් ලබාගත නොහැකි විය.

(ඈ) අපේක්ෂිත කටයුතු සඳහා උපයෝගී කර නොගෙන වසර 05 ක් පුරාම රු.මිලියන 31.28 ක් බැංකුවක ස්ථාවර තැන්පතුවල නිෂ්ක්‍රීයව පැවතීමට ඉඩහැර තිබුණි.

3.3 අත්හැර දැමූ ව්‍යාපෘති

මුළු පිරිවැය රු. 10,200,000 කට ඇස්තමේන්තු කරන ලද ව්‍යාපෘති 06 ක් සමාලෝචිත වර්ෂයේදී අත්හැරදමා තිබූ අතර, ඊට හේතුන් විගණනයට ලබා නොදුනි.

3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයේ කැළි කසල පිලිස්සීමේ හා වලදමා බැහැර කිරීමේ ක්‍රම පමණක් භාවිතා කර තිබුණි. කෙසේවුවද, කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් අර්ථවත් අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

ඵලදායී යන්ත්‍රණයක් ලෙස අයවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත වියදම් හා තත්‍ය වියදම් අතර රු. 55,037 සිට රු. 5,248,870 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය විය.

## 4.2 ප්‍රසම්පාදන සැලැස්ම

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාල සටහන් සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම හෝ ඵලදායී අන්දමින් සභාවේ අභ්‍යන්තර විගණන පරීක්ෂණ කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

## 4.4 විගණන හා කළමනාකරණ කමිටු

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ඩීඑම්ඒ/2009(1) හා 2009 ජූනි 09 දිනැති චක්‍රලේඛයට අනුකූලව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී එක් රැස්වීමක් පවත්වා තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

i. ආදායම් රැස්කිරීම
ii. ස්ථාවර වත්කම්
iii. ගිණුම්කරණය
iv. සේවක සංඛ්‍යාව
v. වාහන උපයෝජනය
vi. මිශ්‍ර තැන්පත්
vii. අයවැය පාලනය
viii. ගබඩා පාලනය
ix. ප්‍රසම්පාදන ක්‍රියාවලිය